ද මැසිනොද් විදුහල - කඳන

De mazenod college - kandana

ඉතිහාසය I

30.03 - 2016

Learning Resource Center
R
De Mazenod College
Kandana

පළමුවාර පරීක්ෂණය 2016 | 9 ශ්‍රේණිය

I කොටස

නිවැරදි පිළිතුර සපයන්න

1) ශ්‍රී ලංකාව පාලනය කළ බටහිර යුරෝපා ජාතීන් අතරින් මුළු රටට පාලනය බටහිර යුරෝපා ජාතිය වන්නේ,
   1. පෘතුගීසි   2. ලන්දේසි   3. බ්‍රිතාන්‍ය   4. ප්‍රංශ

2) ඔවුන්ගෙන් අප රටට ලැබුණු වැදගත් දේශපාලනික බලපෑම වන්නේ,
   1. රාජාණ්ඩු පාලන ක්‍රමය
   2. පාර්ලිමේන්තු ක්‍රමය
   3. පළාත් සභා ක්‍රමය
   4. මද්‍රාසි පාලන ක්‍රමය

3) රාජකාරි ක්‍රමය යනු,
   1. රැකියාවේ දී පැවරුණු කටයුතු
   2. දිනපතා රජුට සේවා සැපයීම
   3. ඉඩම් භුක්තිය වෙනුවෙන් කළ යුතු සේවාව
   4. බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාට සැපයුතු සේවාව

4) රාජකාරි ක්‍රමය අවලංගු කළ බ්‍රිතානය ආණ්ඩුකාරයා වූයේ,
   1. ෆ්‍රෙඩ්රික් නෝර්ත්
   2. තෝමස් මේට්ලන්ඩ්
   3. රොබට් බ්‍රවුන්රිග්
   4. ෆන් එංගල්බෙක්

5) ක්‍රි ව 1798 - 1802 දක්වා ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍යයන් ක්‍රියාත්මක කළ පාලන ක්‍රමය වූයේ,
   1. මද්‍රාසි පාලන ක්‍රමය
   2. ද්විත්ව පාලන ක්‍රමය
   3. කිරීට යටත් විජිත පාලන ක්‍රමය
   4. කොමාන්ඩරි පාලන ක්‍රමය

*සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න*

ප්‍රංශ විප්ලවවාදි හමුදා නෙදර්ලන්තය ආක්‍රමණය කොට එහිද (6) .................................. සමුහාණ්ඩුවක් පිහිටුවිය. එවකට නේදර්ලන්ත (7) .................................. වූ (8) .................................. කමරු ආරක්ෂාව පතා බ්‍රිතාන්‍යයට පලා ගියේය. ඔහුව ඉතා කැමැත්තෙන් භාරගත් බ්‍රිතාන්‍යයෝ (9) .................... මාලිගාවේ රැකවරනය ලබා දුනි ලංකාවේ ලන්දේසි සතු ප්‍රදේශ (10) .................................. ජාතිකයින්ගෙන් ආරක්ෂා කර ගැනිම සඳහා ඒවා බ්‍රිතාන්‍යයන්ට පවරා දෙන ලෙස නේදර්ලන්ත රජුගෙන් ලිපියක් ලබාගත්හ.

කෙටි පිළිතුරු ලියන්න

11) බදු අයකිරීමට මද්‍රාසියෙන් ගෙනවාගත් නිලධාරීන් හැඳින් වූ නම ?

12) රාජාධිරාජසිංහගෙන් පසු උඩරට රජකම හිමිවන්නට තිබුණේ කාටද ?

13) එම රජකම කන්නසාමි කුමරට ලැබුණේ කෙසේ ද ?

14) ලක්දිව අවසාන රජු කවුද ?

15) එම රජු විසින් දළදාමාලිගාවට කළ සේවාව කුමක්ද ?

පහත දක්වෙන කියමන් හරි නම් ✓ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න

16) තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයාගේ දුරදර්ශී ක්‍රියාමාර්ග බ්‍රිතාන්‍යයන්ට උඩරට යටත්කර ගැනීමට මනා පිටුවහලක් විය ( )

17) එතෙක් ස්වාධීනව පැවැති උඩරට රාජයය බ්‍රිතානයයන්ට යටත් වීමට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කෲර ක්‍රියාකලාපයට බෙහෙවින් ඉවහල් විය ( )

18) බ්‍රිතාන්‍යයෝ උඩරට ගිවිසුම මැනවින් ක්‍රියාත්මක කළහ ( )

19) මදුරාසි පාලන ක්‍රමය මගින් පැනවූ බදු අතරින් වඩාත් පීඩාකාරී බද්ද වූයේ රා ආරක්කු බද්දයි ( )

20) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා හමුදාවක් රැගෙන උඩරටට එනවිට උඩරට සියලු ජනකොටස් රජුට සහයෝගය දුන්හ ( )

II කොටස




1. සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුර සපයන්න
   i. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ඉන්දියන් සාගරයේ කෙබඳු ස්ථානයකද ?
   ii. සිතියමේ A, B, C, D, E, F යන වරායන් නම් කරන්න
   iii. අනෙකුත් වරායන්ට වඩා F යන වරාය බ්‍රිතාන්‍ය වැදගත් වූ අකාකරය පැහැදිලි කරන්න

2.
   i. බ්‍රිතාන්‍යන්ට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක කළ පාලන ක්‍රම 3 අනුපිළිවෙළින් දක්වන්න
   ii. මුලින්ම ක්‍රියාත්මක කළ පාලන ක්‍රමය අසාර්ථක වීමට තුඩු දුන් හේතු 4 ක් කෙටියෙන් පහදන්න
   iii. එම පාලනයට විරුද්ධව ක්‍රි.ව 1797 ඇති වූ කැරැල්ලට හේතු සොයා බැලීමට හා විසඳුම් ඉදිරිපත් කිරීමට පත්කළ කොමිෂම කුමක්ද ?
   iv. එම කොමිෂම මගින් ඉදිරිපත් කළ යෝජනා 4 ක් ලියන්න

3.
   i. ද්විත්ව පාලන ක්‍රම යනු කුමක්දැයි පැහැදිලි කරන්න
   ii. ද්විත්ව පාලන ක්‍රමය අසාර්ථක වීමට හේතු දෙකක් විස්තර කරන්න
   iii. ද්විත්ව පාලන ක්‍රමය අසාර්ථක වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මක කළ පාලන ක්‍රමය කුමක්ද ?
   iv. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වූ වර්ෂය දක්වන්න

4.
   i. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ බ්‍රිතානය ආණ්ඩුකාරවරු තිදෙනෙක් නම් කරන්න
   ii. පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා පිහිටවූ දෙපාර්තමේන්තු 3ක් හා ඔහුගේ සෞඛ්‍ය සේවාවන් දෙකක් ලියන්න
   iii. දෙවන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා උඩරට යටත් කර ගැනීමට පහසු කරවීම සඳහා ක්‍රියාත්මක කළ දුරදර්ශී ක්‍රියාමාර්ග දෙකක් පහදන්න

5.
   i. බ්‍රිතාන්‍යයන් උඩරටට ආක්‍රමණ එල්ල කළ අවස්ථා දෙක දක්වන්න
   ii. පළමු වන බ්‍රිතාන්‍ය ආක්‍රමණය අසාර්ථක වීමට හේතු 4ක් කෙටියෙන් විස්තර කරන්න
   iii. දෙවන බ්‍රිතාන්‍ය ආක්‍රමණය සාර්ථක වීමට උඩරට රජු කෙරේ ජනතා ප්‍රසාදය නැතිවීම යන කරුණු සැකවින් දක්වන්න